# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1282/25 – 2003 අප්‍රේල් 03 වැනි බ්‍රහස්පතින්දා – 2003.04.03

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී — බී. 21/78 V.

1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත

1995 අංක 1 දරන විශ්ව විද්‍යාල (සංශෝධන) පනතින් අවසන්වරට සංශෝධිත, 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 18 වන වගන්තිය සමග කියවිය යුතු 24 අ වගන්තිය යටතේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදන ලද නියමාවලිය.

ලේකම්,
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

2003 මාර්තු මස 10 දින දී ය.

නියමාවලිය

01. මේ නියමාවලිය, 2003 අංක 1 දරන ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතන නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලබන අතර එය 2003.04.01 දින සිට බලාත්මක වන්නේ ය.

02. (මෙහි මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජෛව රසායන, අණුක ජෛවවේද හා ජෛවතාක්ෂණ ආයතනය (මෙහි මින් මතු "විශ්ව විද්‍යාලය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකාවේ කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධ වන්නේ ය.

03. (මෙහි මින් මතු "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ විධානයට සහ පාලනයට යටත්ව, ආයතනයට පහත සඳහන් කටයුතු සඳහා එනම් :-

(අ) ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීමට ;

(ආ) ආයතනයේ සහ විශ්ව විද්‍යාලයේ නිර්දේශය මත කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබිය හැකි, ජෛවරසායන විද්‍යාවේ, අණුක ජෛව වේද හා ජෛව තාක්ෂණ විද්‍යාවේ යම් අංශවල අධ්‍යාපනය, පුහුණුව, පර්යේෂණ හා සංවර්ධනය හා උපදේශන සේවා සැපයීමට ;

(ඇ) විශ්ව විද්‍යාලයේ අනුමතය ඇතිව, ජෛව රසායන විද්‍යාව, අණුක ජෛව වේදය හා ජෛව තාක්ෂණ විද්‍යාව පිළිබඳ ප්‍රවීණතාව අත්කර ගෙන සිටින තැනැත්තන් නිශ්චය කර ගැනීමේ කාර්යය සඳහා විභාග පැවැත්වීම සහ ඒ විභාගවලින් සමත්ව, අතුරු

ව්‍යවස්ථාවලින් නියමිත අනෙකුත් කොන්දේසි සපුරා, උපාධි, අභිඥානපත්‍ර, සහතික සහ විශ්ව විද්‍යාලයේ වෙනත් ශාස්ත්‍රීය සාමාර්ථ්‍ය ප්‍රදානය කරනු ලැබීම සඳහා සුදුස්සන්ව සිටින තැනැත්තන්, විශ්ව විද්‍යාලයට නිර්දේශ කිරීමට ;

(ඈ) විශ්ව විද්‍යාලයේ අනුමතය ඇතිව සහ අවශ්‍ය අවස්ථාවල කොමිෂන් සභාවේ එකහත්වය ඇතිව, ජෛව රසායන විද්‍යාව, ජෛව වේදන හා ජෛව තාක්ෂණය පිළිබඳව පිරිනැමිය යුතු උපාධි, අභිඥාන පත්‍ර, සහතික සහ වෙනත් ශාස්ත්‍රීය සාමාර්ථ්‍ය තීරණය කිරීමට ;

(ඉ) ආයතයේ පරමාර්ථවලට සමාන හෝ සාරානුකූලව සමාන පරමාර්ථ ඇති, ශ්‍රී ලංකාවේ හෝ විදේශීය වෙනත් විශ්ව විද්‍යාල හෝ ආයතන සමග, ආචාර්යවරයන් ශිෂ්‍යයන් සහ ශාස්ත්‍රීධරයන් හුවමාරු කර ගැනීමෙන් හෝ අන්‍යාකාරව සහයෝගයෙන් ක්‍රියා කිරීමට ;

(ඊ) ආයතනයට ප්‍රවේශවීම අපේක්ෂා කරන තැනැත්තන් විසින් වෙනත් විශ්ව විද්‍යාලවල දී සහ විශ්ව විද්‍යාල මට්ටමේ අධ්‍යයන ආයතනවල දී සමත් විභාග සහ ගතකළ අධ්‍යයන කාලසීමාව හෝ හැදෑරූ අධ්‍යයන විෂය, අතුරු ව්‍යවස්ථා මගින් නියම කරනු ලැබිය හැකි පරිදි, ආයතනයේ යම් විභාගවලට සහ ඉගෙනීමේ හෝ අධ්‍යයන කාලසීමාවලට හෝ ඉන් යම් කොටසකට හෝ සමාන බවට පිළිගැනීමට විශ්ව විද්‍යාලයේ සනාතන සභාවට නිර්දේශ කිරීම සහ ඕනෑම අවස්ථාවක එම පිළිගැනීම ඉවත්කර ගැනීමට ;

(උ) විශ්ව විද්‍යාලයේ අනුමතය ඇතිව ඉගැන්වීමේ, පුහුණු කිරීමේ, පර්යේෂණ කිරීමේ, සංවර්ධනය කිරීමේ හෝ උපදේශක කාර්ය සඳහා පුස්තකාල, රසායනාගාර හා වෙනත් ගොඩනැගිලි ඉදිකිරීම, ඒවාට උපකරණ සැපයීම හා ඒවා පවත්වා ගෙන යාමට ;

(ඌ) ආයතනයේ කාර්යය සඳහා අවශ්‍ය වියහැකි ආචාර්ය තනතුරු, පරිපාලන තනතුරු හා වෙනත් තනතුරු ඇති කිරීමට, විශ්ව විද්‍යාලයට නිර්දේශ කිරීම සහ එම තනතුරු අහෝසි කිරීම හෝ තාවකාලිකව අත්හිටුවීම සඳහා විධිවිධාන සැළසීමට ;

(එ) අධි ශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ජාත්‍ර දක්ෂිණ, ආධාර ශිෂ්‍යත්ව, පදක්කම් සහ වෙනත් ත්‍යාග ඇති කිරීම සහ පිරිනැමීමට ;

(ඒ) අධ්‍යයන පාඨමාලා හෝ අධ්‍යයන පාඨමාලා වලින් කොටසක් ආයතනයෙන් බාහිරව පැවැත්වීම සඳහා විධිවිධාන යෙදිය යුතු යයි නියම කෙරෙන යම් අතුරු ව්‍යවස්ථාවකට අනුකූලව පාඨමාලා හෝ පාඨමාලා වලින් කොටසක් හෝ බාහිරව පැවැත්වීමට කටයුතු පිළියෙල කිරීමට ;

(ඔ) ආණ්ඩුවේ ප්‍රතිපත්තියට සහ ගාස්තු ගෙවීම නියම කෙරෙන යම් රීතියකට අනුකූලව ගාස්තු ඉල්ලා සිටීම හා ලබා ගැනීමට ; සහ

(ඕ) ආයතනයේ පරමාර්ථ ඉටු කර ගැනීම පිණිස ඉහත කී බලතල, කාර්ය හා කර්තව්‍යවලට ආනුෂංගික හෝ ඒ හේතුවෙන් අවශ්‍ය වන වෙනත් සියලු ක්‍රියා හා දේ කිරීමට,

බලය ඇත්තේ ය.

04. ආයතනයට පහත සඳහන් නිලධරයන් සිටිය යුතු ය :-

(i) අධ්‍යක්ෂවරයා ;

(ii) තනතුරක් වශයෙන් නියමාවලිය මගින්, ප්‍රකාශයට පත්කර ඇත්තා වූ ද ඒ තනතුර දරන්නා, මේ ඡේදයේ කාර්ය සඳහා නිලධරයකු වන්නා වූ ද වෙනත් යම් තනතුරක් දරන්නකු.

05. (i) ආයතනයේ ප්‍රථම අධ්‍යක්ෂවරයා, විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයාගේ නිර්දේශය මත, පාලක සභාව විසින් පත් කරනු ලැබිය යුතු ය. ඉන්පසුව සෑම අධ්‍යක්ෂවරයකුම, කළමනාකරණ මණ්ඩලය නිර්දේශ කරන තැනැත්තන් තිදෙනෙකුගේ මූල මණ්ඩලයකින්, පාලක සභාව විසින් පත් කරනු ලැබිය යුතු ය :

එසේ වුවද කිසිම තැනැත්තකු අනුක්‍රමික ධූර කාල දෙකකට වඩා අධ්‍යක්ෂවරයා ලෙස පත් කරනු නොලැබිය යුතු ය :

එසේම තවදුරටත්, අධ්‍යක්ෂවරයා පත් කිරීම සම්බන්ධව කොමිෂන් සභාවේ එකහත්වය ලබා ගත යුතු ය.

(2) ආයතනයේ අධ්‍යක්ෂවරයා කලින් ධූරය අත්හැරියහොත් මිස, හෝ (3) වන අනුඡේදයේ විධිවිධාන සලස්වා ඇති පරිදි ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, පත් කරනු ලැබූ දින සිට ගණන් බලනු ලබන වර්ෂ තුනක කාලසීමාවක් ගතවීම හෝ ඔහු විශ්‍රාම ගැනීමේ වයස සම්පූර්ණ වීම යන මෙයින් කලින් එළඹෙන දිනය තෙක් ධූරය දරන්නේ ය.

(3) දෝෂාරෝපණ යෝජනාවක් සම්මත කර ගැනීම සඳහා කැඳවනු ලැබූ කළමනාකරණ මණ්ඩලයේ විශේෂ රැස්වීමකදී එම මණ්ඩලයේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් දෙකට නොඅඩු සංඛ්‍යාවකගේ ඡන්දයෙන් සම්මත කර ගනු ලබන දෝෂාරෝපණ යෝජනාවක් මත, පාලක සභාව විසින් අධ්‍යක්ෂවරයා ධූරයෙන් ඉවත් කරනු ලැබිය යුතු ය.

(4) ධූරයෙන් ඉවත් කරන ලද හෝ ධූරයෙන් ඉල්ලා අස්වන අධ්‍යක්ෂවරයකු, අධ්‍යක්ෂවරයා වශයෙන් පත් කරනු ලැබීමට ඉහතින් ම උසස් අධ්‍යාපන ආයතනයක කාර්ය මණ්ඩලයේ සාමාජිකයකුව සිටියේ නම් සහ ඔහු පනතේ දැක්වෙන විශ්‍රාම ගැනීමේ වයසට එළඹී නොමැති නම්, එකී උසස් අධ්‍යාපන ආයතනයේ ඔහුගේ නිත්‍ය තනතුරට ඔහු පෙරළා පැමිණිය යුතු ය.

(5) අධ්‍යක්ෂවරයා රෝගාතුරවීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා ඔහුට ධුරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, එසේ කාර්ය ඉටු කිරීමට නොහැකි වීමෙන් දින හතක් ඇතුළත, ඒ ධුරයේ කාර්ය ඉටු කිරීම සඳහා සුදුසුයයි උපකුලපතිවරයා අදහස් කරන වැඩපිළිවෙලක් යෙදිය යුතු අතර, එසේ වැඩ පිළිවෙලක් යොදන තෙක් ලේඛකාධිකාරිවරයා ඒ ධුරයේ එදිනෙදා කාර්ය කරගෙන යා යුතුය.

(6) අධ්‍යක්ෂ ධුරයෙහි යම් පුරප්පාඩුවක් ඇති වුවහොත්, ඒ පුරප්පාඩුව ඇති වී දින හතක් ඇතුළත, අධ්‍යක්ෂ ධුරයේ කාර්ය ඉටු කිරීම සඳහා සුදුසු යයි උපකුලපතිවරයා අදහස් කරන වැඩ පිළිවෙලක් උපකුලපතිවරයා විසින් යෙදිය යුතු අතර, එසේ වැඩ පිළිවෙලක් යොදන තෙක් ලේඛකාධිකාරීවරයා අධ්‍යක්ෂවරයාගේ කාර්ය ඉටු කළ යුතු ය.

06. (1) අධ්‍යක්ෂවරයා, ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරයා සහ ප්‍රධාන ශාස්ත්‍රීය නිලධරයා වන්නේ ය. ඔහු නිල බලයෙන් ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයකු ද ශාස්ත්‍රීය කමිටුවේ සාමාජිකයකු ද වන්නේ ය. ආයතනයේ වෙනත් යම් බල මණ්ඩලයක හෝ පුද්ගල මණ්ඩලයක යම් රැස්වීමකට පැමිණ සිටීමට හා ඒ රැස්වීමේ දී කථා කිරීමට අධ්‍යක්ෂවරයා හිමිකම් ඇති නමුත් ඔහු ඒ වෙනත් බල මණ්ඩලයේ හෝ පුද්ගල මණ්ඩලයේ සාමාජිකයකු වන්නේ නම් මිස, ඒ යම් රැස්වීමක දී ඡන්දය දීමට ඔහුට හිමිකම නොමැති විය යුතු ය.

(2) මණ්ඩලය විසින් තත් කාර්ය සඳහා නීත්‍යානුකූලව තමා වෙත නිකුත් කරනු ලැබිය හැකි විධානවලට අනුකූලව, නියමාවලියේ, පනතේ හෝ වෙනත් යම් සාධන පත්‍රයක විධිවිධාන ආයතනයට අදාළ වන තාක් දුරට, ඒ විධිවිධාන යථා පරිදි පිළිපදින බවට වගබලා ගැනීම අධ්‍යක්ෂවරයාගේ කාර්යය වන්නේ ය. තවද, ඒ කාර්යය සඳහා අවශ්‍ය යයි ඔහු විසින් සලකනු ලබන සියලු බලතල ඔහුට ඇති අතර ඒ බලතල ඔහු විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

(3) කළමනාකරණ මණ්ඩලයේ තීරණ ක්‍රියාත්මක කිරීම හෝ ක්‍රියාත්මක කිරීමට සැලැස්වීම අධ්‍යක්ෂවරයාගේ කාර්යය විය යුතු ය.

(4) අධ්‍යක්ෂවරයා, ආයතනයේ ගණන් තැබීමේ නිලධරයා වන්නේ ය.

(5) විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයාගේ විධානය යටතේ ආයතනය තුළ විනය පවත්වා ගැනීම පිළිබඳව අධ්‍යක්ෂවරයා වග කිව යුතු ය. විනය පිළිබඳ අතුරු ව්‍යවස්ථා නොමැතිනම්. විශ්ව විද්‍යාලයේ උචිත අතුරු ව්‍යවස්ථා සහ වෙනත් රීති අදාළ විය යුතු ය.

07. ආයතනය, පහත සඳහන් අංශ වලින් සමන්විත විය යුතු ය :-

(i) කළමනාකරණ මණ්ඩලය ;

(ii) ශාස්ත්‍රීය කමිටුව ; සහ

(iii) ආයතනයේ බල මණ්ඩල ලෙස නියමාවලී මගින් නියම කරනු ලැබිය හැකි වෙනත් පුද්ගල මණ්ඩල.

08. (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ මණ්ඩලය, ආයතනයේ ශාස්ත්‍රීය හා විධායක මණ්ඩලය වන අතර, එය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :-

(1) නිල බලයෙන් පත්වන සාමාජිකයන් හය දෙනෙකුගෙන්-

එනම් :-

(අ) අධ්‍යක්ෂවරයා ; ඔහු මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු ය ;

(ආ) උසස් අධ්‍යාපන විෂය භාර ආමාත්‍යවරයාගේ අමාත්‍යංශයේ ලේකම්වරයා ;

(ඇ) විශ්ව විද්‍යාලයේ පරිගණක අධි අධ්‍යයනායතනයේ අධ්‍යක්ෂවරයා ;

(ඈ) විශ්ව විද්‍යාලයේ ජෛවරසායන හා අණුක ජෛව වේද අංශ ප්‍රධානි ;

(ඉ) විශ්ව විද්‍යාලයේ විද්‍යා පීඨයේ පීඨාධිපතිවරයා ;

(ඊ) විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ පීඨාධිපතිවරයා ;

සහ

(2) තවත් සාමාජිකයන් අටදෙනෙක් ; එනම් :-

(අ) විශ්ව විද්‍යාලයේ පාලක සභාව විසින් එහි සාමාජිකයන් අතරින් නම් කරන සාමාජිකයන් දෙදෙනෙක් ;

(ආ) විශ්ව විද්‍යාල සනාතන සභාව විසින් එහි සාමාජිකයන් අතරින් නම් කර විශ්ව විද්‍යාල පාලක සභාව විසින් පත් කරන

සාමාජිකයන් දෙදෙනෙක් ;

(ඇ) තාක්ෂණය. අධ්‍යාපනය. හා ඒ සම්බන්ධ වෘත්තියක හෝ පරිපාලනය යන ක්ෂේත්‍රවල විශිෂ්ඨ සේවයක් ඉටු කර ඇති තැනැත්තන් අතරින් කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සාමාජිකයන් හතර දෙනෙක්.

09. (1) මණ්ඩලයේ සභාපතිවරයා, මණ්ඩලයේ සෑම රැස්වීමකම මුලසුන දැරිය යුතු ය. මණ්ඩලයේ යම් රැස්වීමකට සභාපතිවරයා නොපැමිණි අවස්ථාවක මණ්ඩලයේ සාමාජිකයන් විසින්, පැමිණ සිටින සාමාජිකයන් අතරින් වෙනත් යම්, සාමාජිකයකු ඒ රැස්වීමේ මූලාසනය දැරීම සඳහා තෝරා පත්කර ගත යුතු ය.

(2) යම් නම් කළ හෝ පත් කළ සාමාජිකයකු, කලින් ධූරය අත්හැරියහොත් මිස, නම් කරනු ලැබූ හෝ පත් කරනු ලැබූ දින සිට අවුරුදු තුනක කාලයක් මණ්ඩලයේ සාමාජිකයකු ලෙස ධූරය දැරිය යුතු අතර, ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, නැවත නම් කරනු ලැබීමට හෝ නැවත පත් කරනු ලැබීමට සුදුස්සෙකු විය යුතු ය :

එසේ වුව ද යම් නම් කරනු ලැබූ හෝ පත් කරනු ලැබූ යම් සාමාජිකයකු ඔහුගේ ධූර කාලය ඉකුත් වීමට ප්‍රථම ධූරය අතහැර ගියහොත්, ඔහුගේ අනුප්‍රාප්තිකයා විසින්, ඔහුද ධූරය කලින් අතහැර ගියහොත් මිස, ඔහුගේ පූර්වගාමියාගේ ධූර කාලයෙන් නොගෙවී ඉතිරිව ඇති කාලය තුළ ධූරය දැරිය යුතු ය :

එසේම තවදුරටත්, එක් එක් නම් කරනු ලැබූ හෝ පත් කරනු ලැබූ සාමාජිකයා මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබූයේ යම් තරාතිරමක් ප්‍රකාරව ද එය දරන තාක් කල් ඔහු මණ්ඩලයේ සාමාජික ධූරය දරන්නේ ය.

(3) මණ්ඩලයේ යම් නම් කරනු ලැබූ සාමාජිකයකු විසින්, අධ්‍යක්ෂවරයා වෙත යවන ලිඛිත ඉල්ලීමක් මගින් සාමාජික ධූරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(4) මණ්ඩලයේ යම් පත් කළ සාමාජිකයෙකු විසින් කොමිෂන් සභාවේ සභාපතිවරයා වෙත යවන ලිපියක් මගින් සාමාජික ධූරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(5) මණ්ඩලයේ යම් පත් කළ සාමාජිකයකු, අවසරය නොලබා, මණ්ඩලයේ අනුක්‍රමික රැස්වීම් තුනකට පැමිණීම පැහැර හැරියහොත්, ඔහු මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් ධූරය අත්හැරිය සේ සැලකිය යුතු අතර, පත්කිරීමේ බලධරයා විසින්, යෝග්‍ය තැනැත්තෙකු, ඉන් ඇතිවන පුරප්පාඩුව සඳහා පත් කළ යුතු ය.

(6) මණ්ඩලයේ සාමාජිකයකුට, කොමිෂන් සභාව විසින් මුදල් විෂය භාර අමාත්‍යවරයා විමසා තීරණය කරනු ලැබිය හැකි දීමනාවක් ගෙවිය යුතු ය.

(7) මණ්ඩලයේ රැස්වීමක් සඳහා ගණපූරණය මණ්ඩලයේ සාමාජිකයන් පස්දෙනෙකුට නොඅඩු සංඛ්‍යාවක් විය යුතු ය.

(8) මණ්ඩලය, අවශ්‍ය වන කවර අවස්ථාවක වුව ද රැස්විය යුතු ය. එසේ වුව ද එක් වර්ෂයක් තුළ මණ්ඩලය අට වාරයකට නොඅඩු වාර ගණනක් රැස්විය යුතු ය.

(9) මණ්ඩලයේ සභාපතිවරයා විසින්, අවශ්‍ය යැයි සලකනු ලබන කවර හෝ අවස්ථාවක දී හෝ මණ්ඩලයේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් දෙකෙන් එකකට නොඅඩු සාමාජික සංඛ්‍යාවක් විසින් ඉදිරිපත් කරනු ලබන ලියවිල්ලකින් වූ ඉල්ලීමක්, සභාපතිවරයා වෙත ලැබී සතියක් ඇතුළත දී හෝ මණ්ඩලයේ විශේෂ රැස්වීමක් කැඳවිය යුතු ය. ඒ විශේෂ රැස්වීමෙහි අරමුණ ඒ ලියවිල්ලෙහි අන්තර්ගත විය යුතු ය.

10. (1) පනතේ සහ යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට යටත් ව, මණ්ඩලයට, පහත සඳහන් කාර්ය සඳහා බලය තිබිය යුතු ය :

(අ) ආයතනයේ චංචල හෝ නිශ්චල දේපළ දැරීම, පාලනය කිරීම සහ පරිපාලනය කිරීම ;

(ආ) පනතේ සහ වෙනත් යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට අනුකූලව ආයතනය හා සම්බන්ධ කාරණා විධිමත් කිරීම හා නිශ්චය කිරීම :

(ඇ) ආයතනයේ සාමාන්‍ය පරිපාලනය සහ කළමනාකරණය සඳහා සහ වෙනත් යම් නිශ්චිත කාර්යයක් සඳහා ආයතනයට ලබා දෙන අරමුදල් පරිපාලනය කිරීම සහ පාලනය කිරීම ;

(ඈ) ආයතනයට, අන්තිම කැමති පත්‍ර මගින්, පරිත්‍යාග මගින් සහ වෙනත් ප්‍රදාන වශයෙන් ලැබෙන චංචල හෝ නිශ්චල දේපළ, කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව පිළිගැනීම සහ භාර ගැනීම ;

(ඉ) ආයතනයේ වාර්ෂික වාර්තාව, විගණනය කළ වාර්ෂික ගිණුම් සහ ශේෂ පත්‍රය සලකා බැලීම සහ එම වාර්තාව සහ ගිණුම්, විශ්ව විද්‍යාලයට හා කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීම ;

(ඊ) ඊළඟ වර්ෂය සඳහා ආයතනයේ ඇස්තමේන්තු පිළියෙල කිරීමට සැලැස්වීම සහ අනුමත කිරීමෙන් පසු එම ඇස්තමේන්තු විශ්ව විද්‍යාලයට සහ කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීම ;

(උ) ජෛව රසායන විද්‍යාව, අණුක ජෛව වේදය සහ ජෛව තාක්ෂණය සම්බන්ධයෙන් ප්‍රදානය කරනු ලැබිය යුතු උපාධි, අභිඥාන පත්‍ර, සහතික සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා සහ එවැනි සහතික හා වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා සඳහා සුදුසුකම් ලැබීම පිණිස, ශිෂ්‍යයන් විසින් අනුගමනය කළ යුතු අධ්‍යයන පාඨමාලා සහ පුහුණු පාඨමාලා, සමත් විය යුතු විභාග සහ සපුරාලිය යුතු අනෙකුත් කොන්දේසි, ශාස්ත්‍රීය කමිටුව විමසා, විශ්ව විද්‍යාලය වෙත නිර්දේශ කිරීම

(ඌ) අතුරු ව්‍යවස්ථා හා රීති සෑදීමට බලය දී ඇති කවර හෝ කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා හා රීති සෑදීම ;

එසේ වුව ද ශාස්ත්‍රීය කමිටුවේ වාර්තා සලකා බැලීමෙන් පසුව හැර, අධ්‍යයන පාඨමාලා සහ විභාග සම්බන්ධ අතුරු ව්‍යවස්ථා හෝ රීති කිසිවක් සාදනු නොලැබිය යුතු ය.

(එ) ආයතනයේ කටයුතු පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ගොඩනැගිලි, පරිශ්‍ර, ලී බඩු, උපකරණ සහ වෙනත් ද්‍රව්‍ය සැපයීම;

(ඒ) විශ්ව විද්‍යාලය වෙත -

(i) ආචාර්ය ධූර සහ පරිපාලන ධූර ද ඇතුළුව, ආයතනයේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි ධූර ඇති කිරීම සහ ඒවා අහෝසි කිරීම හෝ අත්හිටුවීම පිළිබඳ නිර්දේශ කිරීම ;

(ii) ආයතනයට පත් කරනු ලබන ආචාර්යවරුන්ට, නිලධරයන්ට සහ වෙනත් සේවා නියුක්තයන්ට තිබිය යුතු සුදුසුකම් නිර්දේශ කිරීම ;

(iii) අවශ්‍ය අවස්ථාවලදී, ආයතනයේ සේවයේ නියුක්ත තැනැත්තන්ගේ සේවය තාවකාලිකව අත්හිටුවීමට ඔවුන් සේවයෙන් පහ කිරීමට හෝ ඔවුන්ට අන්‍යාකාරව දඬුවම් කිරීමට කටයුතු කරන ලෙස නිර්දේශ කිරීම ;

(iv) ආයතනයේ ආචාර්යවරුන් සහ පරීක්ෂකවරුන් ලෙස පත් කිරීම සඳහා සුදුසුකම් ඇති තැනැත්තන් නිර්දේශ කිරීම ;

(ඔ) සුදුසු යැයි සලකනු ලබන ස්ථාවර කමිටු හෝ තත් කාර්ය කමිටු සංඛ්‍යාවක් පත් කිරීම ;

ඒවායේ නිර්ණේය විෂයයක් නියම කිරීම ; වාර්තා සලකා බැලීම හා වෙනස් කිරීම් සහිතව හෝ රහිතව ඒ වාර්තා අනුමත කිරීම හෝ ඒ වාර්තා ප්‍රතික්ෂේප කිරීම ;

(ඕ) ශාස්ත්‍රීය කමිටුව විමසා, සහ විශ්ව විද්‍යාලයේ සහ කොමිෂන් සභාවේ එකහත්වය ඇතිව, කොමිෂන් සභාව විසින් පනතේ 15 වන වගන්තියේ (VII) වන ඡේදය යටතේ තෝරා ගන්නා ශිෂ්‍යයන් හැර, අධ්‍යයන පාඨමාලාවලට ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීම සඳහා තිබිය යුතු සුදුසුකම්, තීරණය කිරීම ;

(ක) නොයෙදවා ඇති යම් ආදායමක් ද ඇතුළුව ආයතනයට අයත් කවර මුදලක් වුව ද, භාර ආඥා පනතේ 20 වන වගන්තියේ විධිවිධාන යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ ආයෝජනය කිරීම නීත්‍යානුකූල වන්නා වූ යම් සුරැකුම්පතක ආයෝජනය කිරීම, නැතහොත් කොමිෂන් සභාවේ අනුමතය ඇතිව ශ්‍රී ලංකාව තුළ නිශ්චල දේපළ මිලට ගැනීම සඳහා එවැනි මුදලක් ආයෝජනය කිරීම හෝ එවැනි ආයෝජන වෙනස් කිරීම හෝ ඒ මුදල් වලින් වියදම සඳහා වහා අවශ්‍ය නොවන යම් මුදල් ප්‍රමාණයක් කොමිෂන් සභාව අනුමත කරන යම් බැංකුවක ස්ථිර තැන්පතුවක් ලෙස තැන්පත් කිරීම ;

(ග) ආයතනයේ ශිෂ්‍යයන්ගේ පොදු සුභ සාධනය සඳහා, සුභ සාධක මණ්ඩලයක්, ඒ මණ්ඩලයේ සංයුතිය, බලතල, කාර්ය සහ කර්තව්‍ය නිශ්චය කිරීමට, ශිෂ්‍යයන්ගේ ද නියෝජනය සහිතව, පත් කිරීම ; සහ

(ච) මේ නියමාවලිය මගින් හෝ වෙනත් යම් උචිත සාධන පත්‍රයක විධිවිධාන සලසා ඇති පරිදි ආයතනයේ බලතලවල ප්‍රතිඵලයක් වන හෝ ඒ බලතලවලට ආනුෂංගික වන, ආයතනයේ වෙනත් සියලු බලතල ක්‍රියාත්මක කිරීම.

(2) ශාස්ත්‍රීය කාරණයක් හා සම්බන්ධ කිසිදු යෝජනාවක්, ඒ පිළිබඳව ස්වකීය මතය වාර්තාගත කර මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට ශාස්ත්‍රීය කමිටුවට අවස්ථාවක් දී ඇත්නම් මිස, මණ්ඩලය විසින් සම්මත කරනු නොලැබිය යුතු ය.

එසේ වුව ද විශ්ව විද්‍යාලයේ එකහත්වය ඇතිව මිස, එසේ සම්මත කරන කිසිම යෝජනාවක් මත ක්‍රියා නොකළ යුතු ය.

මේ ඡෙදයේ "ශාස්ත්‍රීය කාරණය" යන්නෙන්, ශාස්ත්‍රීය කමිටුවේ පාලනයට හා සාමාන්‍ය විධානයට යටතේ යම් කාරණයක් අදහස් වේ.

11. (1) පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ශාස්ත්‍රීය කමිටුවක් තිබිය යුතු ය : —

(අ) අධ්‍යක්ෂවරයා ; ඔහු සභාපති විය යුතු ය ;

(ආ) ආයතනයේ ඉගැන්වීමේ කටයුතුවල යෙදී සිටින, සහ ඒ තනතුරුවලට පත්වීමෙහි ස්ථිර කර තිබෙන ආචාර්යවරුන් සහ ආයතනයේ අනෙකුත් කාර්ය මණ්ඩලය :

(ඇ) විශ්ව විද්‍යාලයේ ජෛව රසායන හා අණුක ජෛව වේද අංශයේ ශාස්ත්‍රීය කාර්ය මණ්ඩලය විසින් තමන් අතරින් පත් කරන සාමාජිකයන් දෙදෙනෙක් :

(ඈ) විශ්ව විද්‍යාලයේ රසායන විද්‍යා අංශය විසින් එහි ශාස්ත්‍රීය කාර්ය මණ්ඩලයෙන් තෝරා පත්කර ගන්නා එක් සාමාජිකයෙක්.

(2) ශාස්ත්‍රීය කමිටුව විසින්, මණ්ඩලයේ එකහත්වය ඇති ව, නිශ්චිත කාර්යයක් සඳහා සහ නිශ්චිත කාලසීමාවක් සඳහා තැනැත්තන් එක්කෙනෙකු හෝ වැඩි සංඛ්‍යාවක් වැඩිපුර එක් කර ගත හැකි නමුත් එසේ වැඩිපුර එක්කර ගන්නා ලද තැනැත්තෙකුට ශාස්ත්‍රීය කමිටුවේ ඡන්ද විමසීමක දී ඉදිරිපත් වීමට හෝ යම් රැස්වීමක දී ඡන්දය දීමට හෝ අයිතියක් නොමැති විය යුතු ය.

(3) 9 වන ඡෙදයේ (2), (4) සහ (5) වන අනුඡේදවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ශාස්ත්‍රීය කමිටුවේ එක් එක් පත් කළ හෝ තෝරා පත්කළ සාමාජිකයාට සහ ඒ සාමාජිකයකු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) ශාස්ත්‍රීය කමිටුවේ රැස්වීමක් සඳහා අවම ගණපූරණය වැඩිපුර එක්කර ගන්නා ලද සාමාජිකයන් ඇතොත් ඔවුන් අත්හැර, එහි සම්පූර්ණ සාමාජිකත්වයෙන් තුනෙන් දෙකකට නොඅඩු සංඛ්‍යාවක් විය යුතු ය.

(5) ශාස්ත්‍රීය කමිටුව අවශ්‍ය කවර හෝ අවස්ථාවක රැස්විය යුතු අතර එක් එක් වර්ෂය තුළ දස වතාවකට නොඅඩු වාර ගණනක් රැස්විය යුතු ය.

12. (1) පනතේ විධිවිධානවලට සහ යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට යටත්ව, ආයතනයේ ඉගැන්වීම, පුහුණු කිරීම, පර්යේෂණ සහ විභාග පිළිබඳ පාලනය සහ සාමාන්‍ය විධානය ශාස්ත්‍රීය කමිටුව සතු විය යුතු ය.

(2) (1) වන අනුඡේදයෙන් ශාස්ත්‍රීය කමිටුවට පැවරී ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, ශාස්ත්‍රීය කමිටුව විසින් :—

(අ) මණ්ඩලය විසින් යොමු කරනු ලබන යම් කාරණයක් සලකා බලා ඒ පිළිබඳ වාර්තා කළ යුතු ය ;

(ආ) අධ්‍යයන පාඨමාලා, ඉගැන්වීමේ වැඩ සටහන්, පුහුණු කිරීමේ වැඩ සටහන්, පර්යේෂණ වැඩ සටහන් හෝ විභාග සම්බන්ධ කාරණ නොවන කාරණා සම්බන්ධව මණ්ඩලය වෙත නිර්දේශ හා වාර්තා ඉදිරිපත් කළ යුතු ය ;

(ඇ) යම් විශේෂ විෂයයක් හෝ විෂයයන් පිළිබඳව සලකා බලා වාර්තා කිරීමේ කාර්යය සඳහා ශාස්ත්‍රීය කමිටුවේ සාමාජිකයන් නොවන තැනැත්තන් ද ඇතුළත් විය හැකි කමිටු පත් කළ යුතු ය ;

(ඈ) මණ්ඩලය වෙත -

(i) අධ්‍යයන පාඨමාලා සඳහා ශිෂ්‍යයන් ඇතුළත් කිරීම සහ විභාග සඳහා නියමයන් නිර්දේශ කළ යුතු ය ;

(ii) ආචාර්යවරයන් හෝ පරීක්ෂකයන් ලෙස පිළිගැනීමට යෝග්‍ය තැනැත්තන් නිර්දේශ කළ යුතු ය ;

(iii) නියමිත විභාග සමත්ව ඇති සහ අනෙකුත් නියමිත කොන්දේසි සම්පූර්ණ කර ඇති, උපාධි, අභිඥාන පත්‍ර, සහතික සහ වෙනත් ශාස්ත්‍රීය සාමාර්ථ්‍යතා පිරිනැමිය යුතු තැනැත්තන් නිර්දේශ කළ යුතු ය ;

(iv) අධි ශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ඡාත්‍ර දක්ෂිණ, ආධාර ශිෂ්‍යත්ව, පදක්කම් සහ වෙනත් ත්‍යාග සඳහා තරඟ කෙරෙන ආකාරය සහ ඊට අදාළ කොන්දේසි නිර්දේශ කළ යුතු ය ;

(v) අධි ශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ඡාත්‍ර දක්ෂිණ, ආධාර ශිෂ්‍යත්ව, පදක්කම් හා වෙනත් ත්‍යාග පිරිනැමීමට සුදුසු තැනැත්තන් නිර්දේශ කළ යුතු ය ; තව ද

(ඉ) මෙම නියමාවලියේ හෝ වෙනත් උචිත සාධන පත්‍රයක, ආයතනයේ බලතල පිළිබඳව ඇති විධිවිධානවලට ආනුෂාංගික හෝ ඒ විධිවිධානවල ප්‍රතිඵලයක් වන ශාස්ත්‍රීය කාරණාවලට අදාළ අනෙකුත් සියලු බලතල ක්‍රියාත්මක කළ යුතු ය.

13. ආයතනයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය, විය යුතු ය.

14. (1) ආයතනයෙහි (මෙහි මින්මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) ජෛව රසායන, අණුක ජෛවවේද හා ජෛවතාක්ෂණ ආයතන අරමුදල යනුවෙන් හැඳින්වෙන අරමුදලක් තිබිය යුතු ය. ඒ අරමුදලට පහත සඳහන් මුදල් ගෙවනු ලැබිය යුතු ය :

(අ) යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට අනුකූලව ආයතනයට ගෙවිය යුතු සියලු ගාස්තු ;

(ආ) පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබ කොමිෂන් සභාව විසින් ප්‍රදාන වශයෙන් ආයතනයට බෙදා දෙන සියලු මුදල් ;

(ඇ) පරිත්‍යාගවලින් අත්වන සියලු ආදායම් ; සහ

(ඈ) කවර වූ හෝ ප්‍රභවයකින් ආයතනයට උපචිත වන වෙනත් සියලු මුදල්.

(2) කිසියම් මාසයක් තුළ දී අරමුදලට ගෙවනු ලබන සියලු මුදල් පිළිබඳ සාරාංශයක් අදාළ ආදායම් ශීර්ෂ යටතේ වර්ග කර, ඊළඟට එළඹෙන මාසය අවසාන වීමට පෙර අධ්‍යක්ෂවරයා විසින් කොමිෂන් සභාවේ දැනගැනීම සඳහා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

15. (i) නියමාවලී මගින් නියම කරන යම් පිළිවෙලකට සහ ආකාරයකට ආයතනයේ ගිණුම් තැබීම ;
(ii) අරමුදල්වලට ගෙවනු ලබන සියලු මුදල් භාර ගැනීම සහ එම මුදල් නිසි ගිණුම් ශීර්ෂවලට බැර කිරීම ;

(iii) බලය දෙනු ලැබූ සියලු ගෙවීම් කිරීම සහ මණ්ඩලය සඳහා කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන ඇස්තමේන්තු සහ ඉදිරි එළැඹෙන වර්ෂය සඳහා වාර්ෂික මූල්‍ය විසර්ජන පිළියෙල කිරීම,

අධ්‍යක්ෂවරයාගේ කාර්යය වන්නේ ය :

එසේ වුව ද නිශ්චිත කාර්ය සඳහා කරනු ලද ප්‍රදානවලින් හෝ නිශ්චිත අරමුණු සඳහා කරන ලද පරිත්‍යාගවලින් ලැබෙන ආදායම ආයතනයේ ගිණුම්වල වෙන වෙනම ගිණුම්ගත කළ යුතු අතර, ආයතනයේ සාමාන්‍ය කාර්ය සඳහා හෝ ඒ ප්‍රදාන හෝ පරිත්‍යාග කරන ලද්දේ පිළිවෙලින් යම් කාර්ය හෝ අරමුණු සඳහා ද ඒවා නොවන කාර්ය හෝ අරමුණු සඳහා හෝ ඒ ආදායමෙන් කිසි ගෙවීමක් නොකළ යුතු ය.

16. (1) ආයතනය විසින් එහි කටයුතුවලට අදාළ වාර්ෂික ගිණුම් ප්‍රකාශයක් සහ සංඛ්‍යාලේඛන, කොමිෂන් සභාව විසින් කලින් කල නිශ්චිතව නියම කරනු ලැබිය හැකි පිළිවෙලකට සහ ආකාරයකට හා එසේ නියම කරනු ලැබිය හැකි විස්තර ද ඇතුළත්ව පිළියෙල කරනු ලැබිය යුතු ය.

(2) ආයතනයේ ගිණුම් පොත් ආයතනයේ කාර්යාලයේ තැබිය යුතු ය.

17. උසස් අධ්‍යාපන ආයතනයක ගිණුම් විගණනයට අදාළව පනතේ XIII වන කොටසේ විධිවිධාන, අවශ්‍ය වෙනස්කිරීම් සහිතව, ආයතනයේ ගිණුම් විගණනය කෙරෙහි හා ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතුය.

18. (1) ආයතනයේ කාර්ය මණ්ඩලය, ආයතනයේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාවේ යෙදීම සහ ඉටුකිරීම සඳහා, විශ්වවිද්‍යාලයේ එකඟත්වය සහ කොමිෂන් සභාවේ අනුමතය ඇතිව පත්කරන ලද නිලධරයන්ගෙන්, ආචාර්යවරුන්ගෙන් සහ සේවා නියුක්තයන්ගෙන් සමන්විත විය යුතුය.

(2) ආයතනයේ කාර්ය මණ්ඩලය, විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය අතරින්, විශ්වවිද්‍යාලය විසින් මුදා හැරීමෙන් හෝ අවස්ථාවෝචිත පරිදි විශ්වවිද්‍යාලය විසින් හෝ කොමිෂන් සභාව විසින් පත් කිරීමෙන් සපයනු ලැබිය යුතු ය. පනතේ X වන කොටසේ විධිවිධාන, ආයතනයේ කාර්ය මණ්ඩලයට පත්කිරීම් සම්බන්ධව, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාල විය යුතු ය.

(3) විශ්වවිද්‍යාලයේ නිලධරයකු, ආචාර්යවරයකු හෝ වෙනත් සේවා නියුක්තයකු ආයතනයේ සේවය සඳහා පූර්ණකාලීන පදනම මත මුදාහැර ඇති අවස්ථාවක විශ්වවිද්‍යාලයේ ඔහුගේ නිත්‍ය තනතුරෙහි ඔහු ලැබූ වැටුප සහ දීමනා ආයතනය විසින් ඔහුට ගෙවිය යුතු ය. එසේ නොවන අවස්ථාවකදී විශ්වවිද්‍යාලය විමසා, ආයතනය විසින්, කොමිෂන් සභාව අනුමත කළ දීමනාවක් එම නිලධරයාට, ආචාර්යවරයාට හෝ වෙනත් සේවා නියුක්තිකයාට ගෙවනු ලැබිය හැකි ය.

(4) ආයතනයේ කාර්ය මණ්ඩලය, අධ්‍යක්ෂවරයාගේ විධානයට හා විනය පාලනයට යටත් විය යුතු ය.

19. ආයතනයේ යම් බලමණ්ඩලයක හෝ වෙනත් පුද්ගල මණ්ඩලයක සාමාජිකත්වයෙහි පුරප්පාඩුවක් තිබීමේ හෝ ඒ සාමාජිකයන් පත්කිරීමෙහි ලා යම් දෝෂයක් හෝ දෝෂ තිබීමේ හේතුවෙන්ම පමණක්, ඒ බල මණ්ඩලයක හෝ පුද්ගල මණ්ඩලයක ක්‍රියාවක්, යෝජනා සම්මතයක් හෝ නීති කෘත්‍යයක් නිර්බල නොවිය යුතු ය.

20. මේ නියමාවලියෙහි-

‘පනත’ යන්නෙන් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත අදහස් වේ ;

‘උචිත සාධන පත්‍රය’ යන්නෙන් පනතේ ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය ;

‘සනාතන සභාව’ යන්නෙන් කොළඹ විශ්ව විද්‍යාලයේ සනාතන සභාව අදහස් වේ ;

‘පාලක සභාව’ යන්නෙන් කොළඹ විශ්ව විද්‍යාලයේ පාලක සභාව අදහස් වේ ;

‘උපකුලපතිවරයා’ යන්නෙන් කොළඹ විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයා අදහස්වේ ;

‘ලේඛකාධිකාරිවරයා’ යන්නෙන් කොළඹ විශ්ව විද්‍යාලයේ ලේඛකාධිකාරිවරයා අදහස් වේ ;

‘ආචාර්යවරයා’ යන්නෙන් පනතේ ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය ;

‘විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව’ යන්නෙන් 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අදහස් වේ ;

‘අතුරු ව්‍යවස්ථා’ යන්නෙන්, පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථා අදහස් වේ ;

‘උසස් අධ්‍යාපන ආයතනය’ යන්නෙන් විශ්වවිද්‍යාල පනතේ 24අ වගන්තිය යටතේ නියමයක් කර ඇත්තේ යම් ආයතනයක් සම්බන්ධව ද, ඒ ආයතනයක් අදහස් වේ.

04-511

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.